# ජේ. ඒ. පොඩි අප්පුහාමි මහතා අක්කරයෙන් වී බුසල් $201\frac{1}{4}$ ලබයි

**ගොවිකම් උපදේශක — ඇස්. බී. ආර්. නිකහැටිය විසිනි.**

ජීවිතය නැමැති මහා සාගරයේ එහා මෙහා යාත්‍රා කර අවසානයේදී ගොවිතැන නැමැති ක්ෂේම භූමිය සොයාගත් පුද්ගලයෙක් ගැනයි, මේ කථාව.

1928 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිහත්පත්තුවේ ඉහළ වලකුඹුර නම් ගමේ ගොවි පවුලකට කුඩා ළමයෙක් ඉපදී ඔහුට දෙමව්පියන් විසින් පොඩිඅප්පුහාමි යන නම තැබුවෝය. "පොඩි" යන කොටස නමට යෙදුවේ පවුලේ බාලයා වූ නිසා වෙන්නට ඇති. වයස අවුරුදු හතේ සිට 17 දක්වා ගමේ පාසලට ගිය නමුත් ඔහුට සමත් වීමට හැකි වූයේ පස්වැන්න පමණි. අවසානයේදී පාසලෙන් ඔහුට අස්වීමට සිදුවූයේ අධ්‍යාපනයට අවශ්‍ය පාසල් උපකරණ ටිකවත් ගැනීමට වත්කමක් නොතිබූ නිසාය. පාසලෙන් පිටවූ පොඩිඅප්පුහාමි නිතරම ඔහුගේ අනාගතය ගැන සිත සිතා කරන්නට කිසිවක් නොමැති හෙයින් දොම්නස් සිතින් පසුවූයේය. අවසානයේදී ඔහුගේ වාසනාව උරගා බැලීම සඳහා දෙමව්පියන්ටත් නොකියා ගම අත්හැර ගියේය.

රුපියල් පනහකුත් ඇතිව පොඩිඅප්පුහාමි පානැගුවේ තම ගමේ අය වැඩි දෙනෙක් රජයෙන් ඉඩම් ලබා ගිය හිඟුරක්ගොඩ ප්‍රදේශය දෙසටයි. කිසිදාක ගමෙන් පිට නොගිය පොඩි අප්පුහාමිට හිතේ බයකුත් තිබුන නමුත් හිඟුරක්ගොඩ පැමිණියේය. එහි පැමිණි වහාම රැකියාවක් ගැන විපරම් කරන්නට පටන් ගත්තේය. තරුණයාගේ අසරණ භාවය නිසා දෝ නාඳුණන කෙනෙක් ඔහුට අනුකම්පා කළේය. පීටර් නැමැති මේ පුද්ගලයා ඔහු වැඩ කරන ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේම, කම්කරුවකු වශයෙන් පොඩි අප්පුහාමිට රැකියාවක් ලබා දුන්නේය. මාසයේ 8 වැනි දින හිඟුරක්ගොඩ ඇවිත් 15 වැනි දින වන විට රැකියාවකුත් ලැබීම ඔහුගේ මහත් වාසනාවක් බව පොඩිඅප්පුහාමි අදත් පවසයි.

දිනකට රුපියලක පඩියකුත් අනිකුත් දීමනා වල් සමග මාසයකට ඔහුට ලැබුණ මුළු ආදායම රු. 85 ක් පමණය. ඒ කාලයේදී තනිකඩයෙකුට මෙම මුදල, ජීවත් වීම පිණිස සෑහුන නමුත් කම්කරුවකු වශයෙන් සේවය කිරීමට පොඩිඅප්පුහාමි එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. මාස අටකින් ඔහු හිඟුරක්ගොඩ-හිඟුරක්දමන ගොවි ජනපදයේ මුරකරුවකු වශයෙන් බැඳුනේය. මෙතැනත් අවුරුදු දෙකක් ගත කර හිඟුරක්ගොඩ-හතමුන ගොවි ජනපදයට මුරකරුවකු වශයෙන් මාරු වී ගියේය. මුර කරුවකු වශයෙන් දුන් ඔහුට රු. 130 ක් පමණ මසකට ලැබෙයි. සිතේ ද වැඩි කරදරයක් නැත. නමුත් මාස අටකි ගත වූයේ අවාසනාවන්ත කාලයක් ඔහුට උදා විය.

ඔහු සේවය කළ ස්ථානයේ සිටි ප්‍රධානීන් මාරු වී ගොස් වෙනත් නිලධාරීන් පිරිසක් පැමිණියේය. ඔවුන් පැමිණි වහාම කළේ පොඩිඅප්පුහාමිගේ මුර සේවය නවතා ඔහු නැවත වරක් කම්කරුවකු වශයෙන් යෙදවීමයි. පඩිය අඩුවීමට වැඩිය මෙතෙක් කල් අවංක සේවයක් කළ පොඩිඅප්පුහාමි මහතාගේ ආත්ම ගෞරවයට මෙය මහත් කැළලක් විය. මෙම නිලධාරීන් ඔහුට කළ නින්දාව ගැන මහත් හිත් වේදනාවකින් පසුවී, අවසානයේදී එය දරා ගත නොහැකිව ඔහු ආපසු උපන් ගම වන ඉහල වලකුඹුරට පැමිණියේය.


සිත් වේදනාවෙන් ගමට ආ නමුත් සඳ කල් එහි සිටීමට ඔහු කොහෙත්ම කැමැත්තක් දැක් වූයේ නැත. මාස දෙකකින් පමණ යළි ගම

අත්හැර සංවර්ධන වී ගෙන එන පලාතක් වන ගල්ඔය ප්‍රදේශය බලා ඔහු ගමන් ගත්තේය. ඉක්මණින් දියුණු වන පලාතක ආරම්භ කළ හැකි හොඳම ව්‍යාපාරය නම් වෙළඳාමයැයි සිතූ පොඩිඅප්පුහාමි මහතා උහන ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කළේය. අනාගත යේදී ලොකු මුදලාලි කෙනෙක් වීමට අහසේ මාලිගා තන තනා වෙළඳාම කළ නමුත් එය ද ටික කලකින්ම කඩාකප්පල් වී නැවත වරක් ගමට පැමිණියේය.

වැඩි කලක් ගතවීමට පෙර ඔහුට කුරුණෑ ගල රැකී රක්ෂා කාර්යාලයෙන් කැඳවා මුර කරුවකු වශයෙන් තෝරා ගන්නා ලදී. මෙවර මුරකරු සේවයට ඔහු ගියේ තඹගල්ල ව්‍යාපාරයටයි. පුරා අවුරුදු දෙකක් මෙතැන සේවය කර එතැනින් දව ගබඩාවකට මුරකරු වශයෙන් මාරු වී ගියේය.

මෙතැන සේවය කරන විට දිනක් ඔහු අතරගල්ල ව්‍යාපාරයේ ඉඩම්, ගොවිතැන සඳහා ගොවීන්ට බෙදා දෙන බවට දැන්වීමක් දුටුවේය. මුර කරුවකු වශයෙන් සෑහෙන වේතනයක් ලැබුණත් මාසික පඩියට සේවය කිරීමට පොඩිඅප්පුහාමි මහතා වැඩි කැමැත්තක් දක්වූයේ නැති නිසාත්, ගොවි ජීවිතය මීට වඩා නිවහල් ජීවිතයක් බව ඔහු සිතූ නිසාත්, මේ ඉඩම් ඉල්ලීමට ඔහුත් සිතුවේය. නමුත් අවාසනාවකි—ඔහු අවිවාහකයෙක් නිසා, ඉඩම් ඉල්ලීමට නොහැකි විය. නමුත් එයින් ඔහු පසුබට නොවීය. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවය කරණ ඔහු කොමසාරිස් තුමාට වෙනම ලිපියක් යවා ඉඩම් ඉල්ලන ලදී. ඔහුගේ මේ ඉල්ලීම යුක්තිසහ ගතයයි සිතූ කොමසාරිස් තුමා ඔහුට අතර ගල්ල ව්‍යාපාරයෙන් කුඹුරු අක්කර 3 ක් හා ගොඩ ඉඩම් අක්කර 2 ක් ලබා දුන්නේය.

තවත් පවුල් 300 ක් පමණ සමග අතර ගල්ල ව්‍යාපාරයට පදිංචියට පොඩිඅප්පුහාමි මහතා ගියේ 1953 වර්ෂයේදීය. නමුත් ඔවුනට ලැබුණේ සම්පූර්ණයෙන් කැලෑ ඉඩම්ය. දිවා රෑ දෙකේ වෙහෙසවී 1958 වන විට ඉඩම් සියල්ලම එළිපෙහෙලි කර කුඹුරු ද අස්වද්දා අවසන් කරණ ලදී. මුල් අවධියේදී පොඩි අප්පුහාමිට රජයෙන් ලැබුණ ආධාර ගැන තවමත් කියයි. මසකට ජීවන වියදම වශයෙන් රු. 30 ද, කනුමුල් ගැලවීමට අක්කරයකට රු. 200 ක මුදලක් ද අවශ්‍ය ගොවි උපකරණ සියල්ලම ද රජයෙන් ඔහුට දී ඇත.



කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩිම අස්වැන්නක් ලබාගත් ජේ. ඒ. පොඩිඅප්පුහාමි මහතා

1953-54 මහ කන්නයේ ප්‍රථමයෙන්ම කුඹුරු ගොවිතැන් කළේ මේ ව්‍යාපාරයේ ගොවීන් සමූහ වශයෙනි. එක් කණ්ඩායමකට 12 බැගින් කුඹුරු ගොවිතැන් කර පළමුවරට කුඹුරු අක්කරයකින් වී බුසල් 40 ක අස්වැන්නක් ඔවුන්ට ලැබින. ඉන්පසු කුඹුරු එක් එක් කෙනාට වෙන් කර දෙන ලදී.

පොඩිඅප්පුහාමි මහතාගේ කුඹුරු කොටස සම්පූර්ණයෙන් අස්වද්දා ඉවර කළේ 1958 දීය. එම වර්ෂයේ මාස් කන්නයට ප්‍රථම වරට ඔහු තනියෙන් වගා කර අක්කරයකට වී බුසල් 90 ක අස්වැන්නක් ලබා ගත්තේය. මෙ පමණ උසස් අස්වැන්නක් ලැබුණේ අලුත් ඉඩම් නිසා වන්නට ඇති. මේ අවධියේදී තමයි, පොඩිඅප්පුහාමි මහතාට ගොවිකම්

දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් මහතෙක් මුන ගැසුනේ. ගොවි තැන ගැන සාකච්ඡා කරන විට උසස් අස්වනු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රම සියල්ලම ඔහුට ඕවර්සියර් මහතා විසින් කියා දෙන ලදී.

ඕවර්සියර් මහතාගෙන්ම මුරුංගකායම් 302 වී වර්ගය රැගෙන එය වගා කර අක්කරයකට වී බුසල් 113 ක් ලබා ගැනීමට හැකි විය. එදා මඳ සුළඟේ එහා මෙහා වැණෙන රන්වන් කරල් දෙස බලා සිටි පොඩිඅප්පුහාමි මහතාට පසුගිය කාලය මතක් විය. "කම්කරුවෙක් වශයෙන් මම වැඩ කළෙමි. මුර කරුවෙකු වශයෙන් මම කීප පලක වැඩ කෙළෙමි. මාසික වේතනයට වැඩ කරනවාට වඩා කොපමණ නිදහස් ද කොපමණ ප්‍රීතිමත් ද, මේ ගොවි ජීවිතය!" කියා ඔහු සිතුවේය. හබල කැඩුනු ඔරුවක් මෙන් මෙතෙක් කල් ඔහු එහා මෙහා පාවුන නමුත් අවසානයේදී ක්ෂේම භූමියට පැමිණ ඇති බව ඔහුට වැටහුණේය.

ක්‍රමයෙන් වී ගොවිතැන දියුණු කරගත් ඔහු 1966-67 මාස් කන්නයේ දීප ව්‍යාප්ත වී ගොවිතැන් තරඟයට ද සහභාගි වී කුරුණෑගල දිස්ත්‍රික්කයේ දක්ෂ ගොවීන් සියල්ලන්ම පරදවා අක්කරයකින් වී බුසල් 201¼ ක අස්වැන්නක් ලබා එම දිස්ත්‍රික්කයේ පළමු වැනි ස්ථානය හිමි කරගත්තේය.


## මෙරට එළවළු ඇට

ඔබට අවශ්‍ය විශාල අස්වැන්නක් ලබාදෙන උසස් වර්ගයේ මෙරට එළවළු ඇට ළඟ ම ඇති කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් හෝ ළඟ ම සිටින කෘෂිකර්ම උපදේශක මහතාගෙන් හෝ ලබාගන්න.